වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT 2021

ඉඩම් මැනුම් සභාව
நில அளவைச் சபை
Land Survey Council

ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාලය,අංක150, කොළඹ 05
நில அளவைச் சபை, நில அளவையாளர் அதிபதி அலுவலகம்,இல.150 பெர்னாட்கொழும்பு 05
Land Survey Council, Surveyor General's Office,No 150, Colombo 05

පටුන

1.	සභාපතිතුමාගේ පණිවුඩය	03
2.	දැක්ම සහ මෙහෙවර	04
3.	ඉඩම් මැනුම් සභාව	05
4.	ඉඩම් මැනුම් සභාවේ කාර්යභාරයන්	06
5.	ඉඩම් මැනුම් සභාව සතු බලතල	07
6.	2021 වර්ෂය තුළදී ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධනය	07
7.	ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය	09
8.	ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම්	10
9.	අධ්‍යයන හා පුහුණු වැඩ කටයුතු	14
10.	මූල්‍ය කළමනාකරණය	15
11.	2021 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශන (ඇමුණුම්)	
	i). මූල්‍ය තත්ව ප්‍රකාශනය	
	ii). මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය	
	iii). හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය	
	iv). මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	
	v). 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ සටහන	
	vi). 2021 දෙසැම්බර් 31 දිනට පොදු ගිණුම් ප්‍රතිපත්ති	
12.	විගණකාධිපති වාර්තාව 2021	

01. සභාපතිතුමාගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව
අංක150, බර්නාඩ් සොයිසා මාවත,
නාරාහේන්පිට, කොළඹ 05
2021.12. 31

2002 අංක 17 දරණ මැනුම් පනත තුළින් ඉඩම් මැනුම් සභාවට පැවරී ඇති කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන වශයෙන් මිනින්දෝරුවරුන් ලියාපදිංචිකිරීම, ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම, වෘත්තීමය මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීයමය විනය පාලනය මැනුම් සභාවේ වගකීම් වේ. එපමණක් නොව, ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට එරෙහිව මහජනයා ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීමත්, ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ තොරතුරු මහජනයා වෙත ලබා දීමත්, වෙනත් වෘත්තීමය ආයතන සමග සමායෝජනය කිරීමත් ඉඩම් මැනුම් සභාවේ වගකීම් වලට අයත්ය. පැවති කොවිඩ් 19 වසංගත තත්වය තුල වුවද ගුණාත්මකව උසස් මැනුම් සේවාවක් සැපයීම වස් වෘත්තීයවේදීන් ශක්තිමත් කිරීමට 2021 වසර තුළද ඉඩම් මැනුම් සභාවට හැකියාවක් ලැබීම පිළිබඳ බෙහෙවින් සතුටුවෙමි.

සෑම මිනින්දෝරු වෘත්තිකයෙකුම තම වෘත්තීය කටයුතු ක්‍රමවත්ව සහ නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වාගැනීමට උනන්දු කරවීමට සකස් කළ රෙගුලාසි අනුව මිනින්දෝරු වෘත්තියේ කටයුතු කිරීමට ඉඩ ප්‍රස්තා තව දුරටත් පුළුල් කිරීමට මෙම වසර තුලද හැකිවීම සුභදායි කරුනක් ලෙසට සිහිපත් කරවමි.

ඉඩම් මැනුම් සභාවේ පවත්වාගෙන යන වෙබ් අඩවිය (www.landsurveycouncil.org) තවදුරටත් පුළුල්කර මහජන හිතකාමී නව මගකට යොමු කරමින් වඩාත් වැඩි දියුණු කරන ලද වෙබ් අඩවියක් සකස් කිරීමට අවශ්‍ය මූලික පදනම මෙවන විටත් ආරම්භ කර ඇති බව සතුටින් දැනුම් දෙමි. ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය මෙන්ම තොරතුරු ලබාදීම වැනි කටයුතු සහ ඉඩම් මැනුම් සභාවෙ ලියා පදිංචි වී ඇති නිවැරදි වෘත්තිකයන් තෝරාගැනීමට මහජනතාවගේ පරිහරණයටද වඩාත් සුදුසු සාර්ථක මාධ්‍යයක් ලෙසද මේ වනවිට මෙම වෙබ් අඩවිය පත්ව ඇත.

ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය මෙන්ම වෘත්තීමය විනය පවත්වා ගැනීම උදෙසා 2021 වසරේදීද ලියාපදිංචි මිනින්දෝරුවරුන් හට අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන පුහුණුපාඨමාලා කිහිපයක්ම අනුමත කොට සෞඛ්‍ය නිරෝධායන නීති රීති අනුව දැඩි දුෂ්කරතා මැද පැවැත්වීමද සුවිශේෂී කරුණක් ලෙස සඳහන් කරමි.

ඉඩම් මැනුම් සභාව සාර්ථකව පවත්වාගෙන යාම සඳහා වැඩ බලන ලේකම්, ගණකාධිකාරී (අර්ධකාලීන) ඇතුළු සමස්ත කාර්යය මණ්ඩලය මෙන්ම උප සභාපති ඇතුළු ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයන්ගෙන් ලැබුණු සහයෝගය සහ කැපවීම පිළිබඳ මාගේ ස්තුතිය පුද කරමි.

ඒ. දිසානායක

සභාපති

02. දැක්ම සහ මෙහෙවර

දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛණ්ඩතාව පවත්වාගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත්වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගීතාව තහවුරු කර ඒ තුළින් තරඟකාරී ගෝලීය වෙළඳපොළ තුළ ගුණාත්මක මෙන්ම වෘත්තීය නිපුණත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වී වෘත්තීයමය පරිසරය ශක්තිමත් කිරීම අපගේ දැක්ම වේ.

මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වාගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තියට ප්‍රවේශ වන්නන් වෙත ලැබෙන බවටත් එම නිසා, වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තීය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බව තහවුරු කිරීම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවරවේ.

03. ඉඩම් මැනුම් සභාව

2002 අංක 17 දරන මැනුම් පනතේ සඳහන් විධි විධාන අනුව 2003 වර්ෂයේ මාර්තු මාසයේදී කොළඹ 05, බර්නාඩ් ද සොයිසා මාවත,අංක 150 දරණ ලිපිනයේ පිහිටා ඇති සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ පළමු මහල තුල ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කරන ලද අතර 2009 වර්ෂයේදී සිට මේ දක්වා එම ගොඩනැගිල්ලේ බිම් මහල තුළ ඉඩම් මැනුම් සභාව පවත්වා ගෙන එනු ලැබේ.

මැනුම් පනතේ 27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සංයුතිය කෙසේ විය යුතුද යන්න පිළිබඳව විධි විධාන සලස්වා ඇත. එකී විධි විධාන වලට අනුව ඉඩම් මැනුම් සභාව සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර එම සාමාජිකයින් පත් වන ආකාරය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයින්

i. සභාපති - සර්වේයර් ජනරාල් වරයා

ii. උප සභාපති - සර්වේයර් ජනරාල් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය සර්වේයර් ජනරාල්ට අඩු නොවන ධූරයක් දරන ලියාපදිංචි මිනින්දෝරු වරයෙකු

iii. සාමාජික - 1969 අංක 21 මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතන පනත මගින් පිහිටුවා ඇති මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ආ) පත්කළ සාමාජිකයින්

i. සාමාජික `- 1982 අංක 22 දරණ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය විසින් නම් කරනු ලබන ඉඩම් මැනීම පිළිබඳ පුළුල් අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂ සාමාර්ථයන් දරණ මිනින්දෝරුවරුන් තිදෙනෙක්

ii. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතින් පිහිටවූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, විශ්ව විද්‍යාලයක අධ්‍යාපන, පරිපාලන, කළමනාකරණ හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂෙත්‍රයන් හි එක් විද්වතෙකු

iii. මෙම පත්කිරීම් අමාත්‍යවරයා විසින් කරනු ලැබේ.

04. ඉඩම් මැනුම් සභාව වෙත පැවරී ඇති කාර්ය භාර්යයන්

ඉඩම් මැනුම් සභාවේ කාර්යන් මැනුම් පනතේ 37 වගන්තිය යටතේ පහත පරිදි දක්වා ඇත.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්ය පටිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනීමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය විනය පවත්වාගෙන යාම.

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර බාර ගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි ඔවුන් ලියාපදිංචි කිරීම.

(ඇ) වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර බාර ගැනීම සහ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීමට එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවන්හි ඔවුන්ට එම බලපත්‍ර නිකුත් කිරීම.

(ඈ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම.

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින සහ වාර්ෂික වෘත්තීය බලපත්‍ර ලබා ගැනීමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වෘත්තීමය සංවර්ධන වැඩ සටහන් ප්‍රවර්ධනය කිරීම.

(ඊ) ඉඩම් මැනීම පිළිබඳ ශාස්ත්‍රීය හා වෘත්තීමය සුදුසුකම් පිළිගැනීම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවරුන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තීමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා වූ අපේක්ෂාවෙන් වෙනුවෙන් සුදුසුකම් ලැබීමේ විභාග හා වෘත්තීමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

(උ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවලදී සම තත්වයක් සහ අන්‍යෝන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යෝන්‍ය වැඩ පිළිවෙළවල් සඳහා එකඟතාවය ඇති කර හා ක්‍රියාත්මක කිරීම.

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු අධ්‍යාපන හා පුහුණු කටයුතු පිළිබඳව නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

(එ) ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ වෘත්තීමය ආයතන හා සම්බන්ධ වෙමින් උසස් වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම

05. ඉඩම් මැනුම් සභාව සතු බලතල

ඉඩම් මැනුම් සභාව වෙත පැවරෙන බලතල මැනුම් පනතේ 38 වැනි වගන්තිය යටතේ පහත පරිදි දක්වා ඇත.

(අ) යම් වංචල හෝ නිශ්චල දේපළ අත්කරගැනීම,දැරීම, බද්දට හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම,විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

(ආ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග බාරගැනීම සහ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඒවා යොදාගැනීම .

(ඇ) සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

(ඈ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම.

(ඉ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත් කිරීම.

(ඊ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

(උ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම.

(ඌ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍යය නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු දේ කිරීම.

06. 2021 වර්ෂය තුලදී ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධනය

1. 2021 ජනවාරි මස 1සිට දෙසැම්බර් මස 31 දක්වා කාලය තුල ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයන්

සමාලෝචිත වර්ෂය තුල එනම්, 2021 ජනවාරි මස 1 සිට දෙසැම්බර් මස 31දක්වා කාලය තුළ ඉඩම් මැනුම් සභාවේ පහත නම් සඳහන් අය සාමාජිකයින් ලෙස කටයුතු කරන ලදී.

i. ඒ.එල්.එස්. සී. පෙරේරා මහත්මිය, සභාපති -2021.01.01 සිට 2021-05.31 දක්වා

ii. ඩබ්.ටී.එම්.එස්. බී. තෙන්නකෝන් මහතා, සභාපති -2021.06.01 සිට 2021.11.17 දක්වා

iii. ඒ.දිසානායක මහතා, සභාපති -2021.11.18 සිට 2021.12.31 දක්වා

iv. ඩබ්.ටී.එම්.එස්. බී. තෙන්නකෝන් මහතා, උප සභාපති -2021.01.01 සිට 2021.05.31 දක්වා

v. ඒ.දිසානායක මහතා, උප සභාපති -2021.05.31 සිට 2021.11.17 දක්වා

vi. ආර් පලිහක්කාර මහතා , උප සභාපති -2021.11.18 සිට 2021.12.31 දක්වා

vii. එන්.ජේ.විජේනායක මහතා, සාමාජික - 2021.01.01 සිට 2021.10.13 දක්වා

viii. කේ.කේ.එස්.රත්නායක මහතා, සාමාජික -2021.10.14 සිට 2021.12.31 දක්වා

ix. එන්. ඒ. ගුණවර්ධන මහතා, සාමාජික -2021-01-01 සිට 2021-12-31 දක්වා

x. ජේ.එම්. විජේවර්ධන මහතා, සාමාජික -2021.01.01 සිට 2021.12.31 දක්වා

xi. කේ.ඒ.කේ.එල්. එදිරිසිංහ මහතා, සාමාජික -2021.01.01 සිට 2021.12.31 දක්වා

xii. ආචාර්ය කේ.එම්.සි. කොන්තෙසිංහ මයා සාමාජික -2021.06.01 සිට 2021.12.31 දක්වා

2. 2021 දෙසැම්බර් මස 31දිනට සභාවේ සිටි සමාජිකයන්ගේ මුළු සේවා කාලය

2021 දෙසැම්බර් මස 31 දිනට සිටි සභාවේ සාමාජිකයින් සේවය කරන ලද මුළු සේවාකාල පරිච්ඡේදයන් පහත දක්වා ඇත.

i. ඒ.එල්.එස්.සී පෙරේරා මහත්මිය - (සභාපති) 2020.02.26 සිට (අවු. 01 මාස 03 දින 02)

ii. ඩබ්.ටී.එම්.එස්.බී.තෙන්නකෝන් මහතා (සභාපති) -2021.06.01 සිට (අවු. 00 මාස 06 දින 18)

iii. ඩබ්.ටී.එම්.එස්.බී.තෙන්නකෝන් මහතා (උප සභාපති) -2020.02.26 සිට (අවු. 01 මාස 03 දින 03)

iv. ඒ. දිසානායක මහතා (සභාපති) -2021.11.18 සිට (අවු. 00 මාස 01 දින 12)

v. ඒ. දිසානායක මහතා (උප සභාපති) -2021.06.01 සිට (අවු. 00 මාස 07 දින 00)

vi. රංජිත් පලිහක්කාර මහතා (උප සභාපති) -2021.11.18 සිට (අවු. 00 මාස 01 දින 12)

vii. එන්.ජේ.විජේනායක මහතා (සාමාජික) -2020.03.17 සිට (අවු. 1 මාස 06 දින 27)

viii. කේ.කේ.එස් රත්නායක මහතා (සාමාජික) -2021.10.14 සිට (අවු. 00 මාස 02 දින 18)

ix. එන්. ඒ. ගුණවර්ධන මහතා (සාමාජික) -2021.01.01 සිට (අවු. 01 මාස 00 දින 00)

x. ජේ.එම්.විජේවර්ධන මහතා (සාමාජික) -2021.01.01 සිට (අවු. 01 මාස 00 දින 00)

xi. කේ.ඒ.කේ.එල්. එදිරිසිංහ මහතා (සාමාජික) -2021.01.01 සිට (අවු. 01 මාස 00 දින 00)

xii. ආචාර්ය කේ.එම්.සි. කොන්තෙසිංහ මහතා (සාමාජික) -2021.06.01සිට (අවු.00 මාස 07 දින 00)

3. සභාවේ රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ සහභාගිවීම්

2021 වර්ෂය තුලදී එක් එක් සාමාජිකයින් සභා රැස්වීම් වලට සහභාගි වී ඇති වාර ගණන පහත දක්වා ඇත.

	රැස්වීම් ගණන
i. ඒ. එල්.එස්.සි. පෙරේරා මහත්මිය (සභාපති)	-05
ii. ඩබ්. ටී.එම්`.එස්.බී තෙන්නකෝන් මහතා (උප සභාපති)	-06
iii. ඒ. දිසානායක මහතා (සභාපති)	-03
iv. ඩබ්.ටී.එම්`.එස්.බී තෙන්නකෝන් මහතා (සභාපති)	-06
v. ඒ.දිසානායක මහතා (උප සභාපති)	-06
vi. ආර්. පලිහක්කාර මහතා (උප සභාපති)	-03
vii. එන්.ඒ. ගුණවර්ධන මහතා (සාමාජික)	-13
viii. කේ.ඒ. කේ.එල්. එදිරිසිංහ මයා (සාමාජික)	-15

ix. ජේ.එම්. විජේවර්ධන මහතා (සාමාජික) -14
x. එන්.ජේ.විජේනායක මහතා (සාමාජික) -09
xi. කේ.කේ.එස්.රත්නායක මහතා (සාමාජික) -04
xii. ආචාර්ය කේ.එම්.සී. කොන්තෙසිංහ මහතා (සාමාජික) -03

07. ඉඩම් මැනුම් සභාවේ කාර්යාලීය කාර්යය මණ්ඩලය

මැනුම් පනතේ 55 වැනි වගන්තිය මගින් සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යයයි සභාව සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් පත් කර ගැනීමට මැනුම් සභාවට බලය පැවරී ඇත. ඒ අනුව, පහත නම් සඳහන් කාර්ය මණ්ඩලය සමාලෝචිත කාල සීමාව තුළ මැනුම් සභාවේ කාර්යාලීය කාර්ය මණ්ඩලය ලෙස කටයුතු කර ඇත.

i. එම්.එන් අමරසිරි මයා - 2021.12.01 සිට 2021.12.31 දක්වා
වැඩ බලන ලේකම්

ii. ජී.ඩී.එස්.එල්.කුළතුංග මයා - 2021.01.01 සිට 2021.11.30 දක්වා
වැඩ බලන ලේකම්

iii. එම්. සාලිය ධර්මවර්දන මයා - 2021.01.01 සිට 2021.12.31 දක්වා
මුදල් අමාත්‍යාංශය නියෝජිත

iv. ඩබ්. එම්.එස්. පෙරේරා මිය - 2021.01.01 සිට 2021.09.30 දක්වා
ගණකාධිකාරී (අර්ධකාලීන)

v. කේ.එල්.ඒ.එන්. සඳමාලි මිය - 2021.10.01 සිට 2021.12.31 දක්වා
ගණකාධිකාරී (අර්ධකාලීන)

vi. ඩබ්ලිව්.ඒ.එස්.ප්‍රියදර්ශනී මිය - 2021.01.01 සිට 2021.12.31 දක්වා
කළමණාකාර සහකාර

vii. ආර්.එම්.එන්.රත්නායක මහත්මිය - 2021.01.01 සිට 2021.12.31 දක්වා
කළමණාකාර සහකාර

viii. ටී.ජී.ප්‍රනාන්දු මහතා - 2021.01.01 සිට 2021.12.31 දක්වා
කාර්යාල කාර්ය සහායක

ix. කේ.පී.ගුණසිංහ මිය - 2021.01.01 සිට 2021.12.31 දක්වා
කළමණාකාර සහකාර (කොන්ත්‍රාත් පදනම)

x. ජී.ඩී.එච්.කේ කුලතුංග මිය - 2021.01.01 සිට 2021.12.31 දක්වා
කළමණාකාර සහකාර (කොන්ත්‍රාත් පදනම)

08. ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම්

1. ලියාපදිංචි කිරීම්


සමාලෝචිත වර්ෂය සඳහා, එනම්, 2021 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ලද පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ඒ එක් එක් මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම්, පළපුරුද්ද, හැකියාව සහ නිපුණතාවය ඇති බවට පරීක්ෂා කර බලන ලදී.

ඒ අතුරින් සභාව සෑහීමකට පත්වීමෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළදී බලයලත් මිනින්දෝරු 34 ක් ඉඩම් මැනුම් සභාව විසින් අලුතින් ලියාපදිංචි කරන ලදී. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිය ලබා ගත් මුළු මිනින්දෝරු සංඛ්‍යාව 2369 කි.

2. වෘත්තියේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර

සමාලෝචිත වර්ෂය සඳහා මැනුම් වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර බාර ගැනීම 2020 ඔක්තෝබර් මාසයේදී අරඹන ලදී. අනතුරුව, ඒ සඳහා එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව පරීක්ෂා කර බැලීමෙන් පසුව 2021 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාව විසින් වාර්ෂික බලපත් 1331 ක් නිකුත් කරන ලදී. මෙය, 2020 වසර තුළ නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍ර සංඛ්‍යාව වන 1320 සමඟ සැසඳීමේදී 0.75% ක වැඩි වීමක් බව නිරීක්ෂණය වේ.

2020 සහ 2021 වසර තුළදී, ඉඩම් මැනුම් සභාව විසින් මිනින්දෝරුවරුන් වෙත නිකුත් කරන ලද වාර්ෂික මැනුම් බලපත්‍ර පිළිබඳ සංඛ්‍යාමය තොරතුරු පහත දැක්වෙන 1 වන රූපය මගින් ප්‍රස්තාරිකව නිරූපනය කර ඇත.



1 වන රූපය

2021 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ සමාලෝචිත වර්ෂය සඳහා 2021 මාර්තු මස 31 දිනට වාර්ෂික මැනුම් බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මූලික තොරතුරු එනම්, මුලකුරු සමඟ නම, ලියාපදිංචි අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය යන තොරතුරු 2021 අගෝස්තු මස 13 වන දිනැති අංක 2241 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර පළ කිරීමට සභාව කටයුතු කරන ලදී.

එයට අමතරව, වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ අදාළ සියලු තොරතුරු එනම්, ලියාපදිංචි අංකය, මුලකුරු සමග නම, සම්පූර්ණ නම, ජාතික හැඳුනුම් පත් අංකය, පදිංචි දිස්ත්‍රික්කය, ලිපිනය, දුරකථන අංක, වෘත්තීයේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර අංකය හා බලපත්‍රය වලංගු කාලසීමාව ආදී තොරතුරු ඉඩම් මැනුම් සභාවේ නිල වෙබ් අඩවියට www.landsurveycouncil.org ඇතුළත් කර ඇත. මෙම විස්තර ත්‍රෛමාසිකව යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කර ඇත.

3. මහජනතාව වෙත තොරතුරු ලබා දීම.

ඉඩම් මැනුම් සභාව විසින් ලබාදෙන සේවාවන් පිළිබඳව මහජනතාව මේ වන විට මනාව දැනුවත් වී ඇත. එබැවින්, වසර සිය ගණනක් පැරණි පිඹුරු සම්බන්ධයෙන් වුවද, ඊට අදාළ මැනුම් කටයුතු කර ඇති බලයලත් මිනින්දෝරුවරුන්ගේ ජීව දත්ත තොරතුරු ලබා ගැනීම සඳහා ඉඩම් මැනුම් සභාව වෙත පැමිණෙන පිරිස් පසු ගිය කාලය තුළ සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ඊට අමතරව, විද්‍යුත් තැපෑල මගින්ද එම තොරුතුරු සඳහා නිරතුරුවම ඉල්ලීම් ලැබේ. එම තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා දීමට,මැනුම් සහා කාර්ය මණ්ඩලය මෙහත් කැපවීමකින් කටයුත කරන අතර. එහිදී එම තොරතුරු එසැනින් ලබා

දීමට හැකි සෑම විටම කටයුතු කරනු ලැබේ. සමාලෝචිත කාල සීමාව තුළ මහජනතාවගේ ඉල්ලීම් අනුව අවස්ථා 86 ක දී තොරතුරු ලබා දී ඇත.

වාර්ෂික බලපත්‍රලාභී සියලුම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ පෞද්ගලික ලිපිනය, ලියාපදිංචි අංකය, දුරකථන අංකය, වාර්ෂික බලපත්‍ර අංක ආදී තොරතුරු ඇතුළත් පරිගණක ගත දත්ත පද්ධතියක් මැනුම් සභාව විසින් සකස් කර පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. ඊට අමතරව, ඔවුන්ගේ ඡායා රූපයක්ද එම දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. මෙම දත්ත පද්ධතියට ඔවුන්ගේ දුරකථන අංක ඇතුළු සම්බන්ධතා තොරතුරු ඇතුළත් කර ඇති නිසා අවශ්‍ය පිඹුරු වල පිටපත් ලබා ගැනීමට ඔවුන් කෙලින්ම සම්බන්ධ කර ගැනීමේ පහසුකම මෙමගින් මහජනතාවට ලැබී ඇත. එතකුදු වුව ද, මේ දක්වා මැනුම් සභාව විසින් ලබා දෙන මෙම සේවාව හරහා මහජනතාවට අවශ්‍ය බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙල කළ පැරණි පිඹුරු වල පිටපත් ලබා ගැනීමේ ක්‍රම වේදයක් සකස් කිරීමට නොහැකි වී ඇත. මැනුම් කටයුතු සම්බන්ධයෙන් මහජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් ලෙස මෙය හඳුනා ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදයක් සැලසුම් කිරීමට සභාවේ අවධානය මේ වන විට යොමු වී ඇත.

4. ඉඩම් මැනුම් සභාව වෙත ලද මහජන පැමිණිලි

බලයලත් මිනින්දෝරුවරුන් විසින් සිදු කරනු ලබන මැනුම් කටයුතු හා පිළියෙල කරනු ලබන පිඹුරු වලට සම්බන්ධව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීම ඉඩම් මැනුම් සභාව සතු තවත් එක් ප්‍රධාන කර්තව්‍යයකි. හුදෙක්, මෙම පැමිණිලි විභාග කෙරෙනුයේ මැනුම් පනතේ 46 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන වලට යටත්ව වේ. පැමිණිලි විභාග කිරීම සඳහා සෑම මසකට වරක් ඉඩම් මැනුම් සභාව රැස්වෙන අතර එක සභා වාරයකදී පැමිණිලි 6 ක් හෝ 7 ක් විභාග කිරීමට කටයුතු කරයි. මෙමගින්, මහජනතාවට ඉඩම් ගැටළු සම්බන්ධයෙන් පවතින ගැටළු බොහෝ දුරට නිරාකරණය කර ගැනීමට හැකි වන අතර මිනින්දෝරුවරුන් අතර විනය පවත්වා ගෙන යාමට ක්‍රියාමාර්ගයක්ද සැලසෙනු ඇත.


කෙසේ වුවද, සමහර පැමිණිලිවල ස්වභාවය අනුව එනම්, අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත්, චෝදනා ඔප්පු කිරීමට තරම් වූ සාක්ෂි නොමැති, අධිකරණ නියෝග අනුව උසාවි කොමසාරිස්වරුන් ලෙස කරන ලද මැනුම් සහ ඉඩම් මැනුම් සභාවේ බලතල යටතේ ක්‍රියාකළ නොහැකි ගණයේ පැමිණිලි සම්බන්ධව ඉඩම් මැනුම් සභාව තීරණ ලබා නොදෙන අතර, එවැනි අවස්ථාවලදී අදාල පැමිණිලිකරුවන්ට එම ගැටළු අධිකරණ ක්‍රියා මාර්ගයෙන් විසඳා ගැනීමට අවශ්‍ය උපදෙස් දෙනු ලැබේ.

2020 වසරේ ලැබී විභාග කර අවසන් නොවූ පැමිණිලි හා 2021 වසරේ තුළ විභාග කළ පැමිණිලි පිළිබඳ සංඛ්‍යා තොරතුරු මෙහි පහතින් දැක්වේ.

2020 දෙසැම්බර් මස 31 දිනට විභාග අවසන් නොවී ඉතිරිව තිබූ සංඛ්‍යාව	= 80
2021 වසර තුළදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව	= 63
2021 වසර තුළදී විභාග අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව	= 39
2021 දෙසම්බර් 31 දිනට විභාග අවසන් නොවී ඉතිරි වූ සංඛ්‍යාව	= 104

2020 වසර තුළදී ලද පැමිණිලි සංඛ්‍යාව 67 වූ අතර එයට සාපේක්ෂව 2021 වසර තුළ පැමිණිලි ලැබීමේ ප්‍රතිශතය 5.9% කින් අඩුවී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලි විභාග අවසන් කිරීම 2020 වසරේදී 33 ක් වූ අතර එයට සාපේක්ෂව 2021 වසරේ පැමිණිලි විභාග කිරීමේ ප්‍රතිශතය 18.2% කින් වැඩි වී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම දත්ත පහත දැක්වෙන 2 වන රූපය මගින් ප්‍රස්ථාරිකව නිරූපණය කර ඇත.



2 වන රූපය

5. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග

මැනුම් කටයුතු කිරීමේදී විෂමාචාර ක්‍රියාවන් කර ඇති බවට සභාව නිගමනය කර ඇති විටෙක එවැනි අයට එරෙහිව 2002 අංක 17 දරණ මැනුම් පනතේ 47 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව දඩුවම් පමුණුවා ලිය හැක.

2021 වසරේදී ඉඩම් මැනුම් සභාව විසින් ඉහත 4 වැනි ඡේදයෙහි විස්තර කර ඇති පරිදි,

උත්තරකාර මිනින්දෝරුවරුන්ට පරීක්ෂණ ගාස්තු අයකිරීමක් සහ අවවාද කිරීම හැර ලියා පදිංචිය අවලංගු කිරීම හෝ වාර්ෂික බලපත්‍රය අවලංගු කිරීම වැනි දඬුවම් පැමිනවීමේ අවස්ථාවක් සිදු නොවිය. එබැවින් ඒ සම්බන්දව ගැසට් පත්‍රයේ පළ කිරීමේ අවශ්‍යතාවයක් පැනනොනඟින ලදී.

09. අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

1. අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CDP) පාඨමාලා

බිම්මැනීම හා සම්බන්ධ විෂයයන් ගත්කළ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අත්‍යවශ්‍ය අංගයක් වේ. මැනුම් වෘත්තීයේ යෙදී සිටින සහ මැනුම් සභාවේ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂා කරන වෘත්තිකයන්ගේ දැනුම සහ දක්ෂතා වැඩි දියුණු කරලීම සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉඩම් මැනුම් සභාව සතු කාර්යක් බවට මැනුම් පනතේ 37 වැනි වගන්තිය යටතේ විධි විධාන සලස්වා ඇත. එබැවින් සියලුම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් මැනුම් වෘත්තිය හා සම්බන්ධව නූතන තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳව වූ පුහුණු පාඨමාලා / වැඩමුළු වලට සහභාගි කරවීම සඳහා උනන්දු කරවීම ඉඩම් මැනුම් සභාව විසින් සිදු කරනු ලබයි.

මෙහිදී, පුද්ගලික මැනුම් වෘත්තියෙහි නියලීමට අපේක්ෂා කරන ආධුනික මැනුම් වෘත්තිකයන් දිශානුගත කිරීමේ වැඩසටහන් මෙන්ම පළපුරුදු මිනින්දෝරුවරුන් සඳහා දියුණු තාක්ෂණික ක්‍රම වලට අදාල වැඩසටහන් ද වෙන් වශයෙන් පවත්වනු ලැබේ. තවද, ඉඩම් මැනුම් සභාවට අමතරව, එහි නියාමනය යටතේ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගම් වැනි පිළිගත් ආයතන මගින්ද මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ.

2. ප්‍රථම වරට වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ලබාගන්නා මිනින්දෝරුවරුන් සඳහා වැඩමුළු

ඉඩම් මැනුම් සභාව විසින් වෘත්තියේ යෙදීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් වෙත ලබා දෙන වාර්ෂික මැනුම් බලපත්‍රය යොදා ගනිමින් වෘත්තීය මිනින්දෝරුවරුන් ලෙස තම ජීවන වෘත්තියට ප්‍රථම වරට පිවිසෙන අවස්ථාවේදී ඔවුන් සඳහා දිශානුගත කිරීමේ පාඨමාලා පැවැත්වීම ඉඩම් මැනුම් සභාව විසින් වාර්ෂිකව සිදු කරයි. එම පාඨමාලාවල දී සම්පත් දායකත්වය සඳහා තාක්ෂණික දැනුමක් හා පළපුරුද්දක් සහිත කීර්තිමත් ලියාපදිංචි මිනින්දෝරුවරුන් යොදා ගනිමින් නවක මිනින්දෝරුවන් හට අවශ්‍ය දැනුම සහ අවබෝධය ලබා දීම සිදු කෙරෙනු ඇත.

3. බාහිර ආයතන විසින් පවත්වනු ලැබූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා

ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් ලියාපදිංචි මිනින්දෝරුවරුන් සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීමෙහි ලා විශේෂ උනන්දුවකින් කටයුතු කරයි. එම පාඨමාලා ඉඩම් මැනුම් සභාවේ නියාමනය යටතේ පවත්වනු ලබන අතර ඒ සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ බාහිර ආයතන දක්වනු ලබන උනන්දුව පිළිබඳ ඉඩම් මැනුම් සභාව අතිශයින් සතුටට පත් වේ.

2021 වසරේදී පවත්වා ඇති අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

අනු අංකය	ආයතනය	වෘත්තීය සංවර්ධන පාඨමාලාව	පැවැත්වූ දිනය
1	මැනුම් හා සිතියම්ගතකිරීමේ ආයතනය-දියතලාව	Global Navigation Sattellite System(GNSS)	2021.03.30
2	මැනුම් හා සිතියම්ගතකිරීමේ ආයතනය-දියතලාව	GNSS Applications	2021.10.28
3	ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය	Land Law for Surveyors	2021.11.27


10. මූල්‍ය කළමනාකරණය

1). මුළු ආදායම සහ මුළු වියදම

2021 වසර තුළදී ඉඩම් මැනුම් සභාව රැස් කරන ලද මුළු ආදායම රු.6,498,076.97ක් වූ අතර එම වසර තුළදී දරන ලද මුළු වියදම 5,539,161.98 විය. ඒ අනුව 2020 වසර සමග සැසඳීමේදී, 2021 වසර තුළදී සභාව රැස් කරන ලද ආදායම 1,929,492.87 කින් අඩු වී ඇති අතර වියදම රු. 979,946.87 කින් වැඩි වී ඇත.

පහත දැක්වෙන 3 වැනි රූපයේ 2020 සහ 2021 වසර වල මුළු ආදායම සහ වියදම ප්‍රස්ථාරිකව නිරූපණය කර ඇත.

2).



3 වැනි රූපය

සභාවේ අරමුදල් සහ මූල්‍ය කළමනාකරණය

මැනුම් පනතේ 56 (2) වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ අරමුදල් රැස් කළ යුතු ආකාරය විස්තර කර ඇත. ඒ අනුව, ඒකාබද්ද අරමුදලින් ලැබිය හැකි මුදල් ද, මැනුම් පනත යටතේ සභාවට දී ඇති බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙන් සහ ඉටු කිරීමෙන් සභාවට ලැබෙන මුදල් ද සභාවට බැර කළ යුතු වේ. එයට අමතරව ත්‍යාග, ප්‍රධාන සහ පරිත්‍යාග වශයෙන් සභාවට ලැබෙන මුදල් ද සභාවේ අරමුදලට එකතු වේ. සභාවේ කාර්යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීමේදී වැය වන මුදල් මැනුම් පනතේ 56(3) වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව මෙම අරමුදලින් ගෙවිය යුතු වේ.

2021 වසරේදී ද පෙර වසර මෙන් කිසිදු ප්‍රතිපාදන මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලැබී නැත. එබැවින් මැනුම් සභාවේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී ඊට අදාළ සියලු ආයතනික සහ පරිපාලන වියදම් දරන ලද්දේ එමගින් රැස් කර ගන්නා අරමුදල් මගිනි. මැනුම් සභාවේ සියලු මුදල් මැනුම් සභාව විසින් කළමනාකරණය කරනු ලැබේ.

මැනුම් සභාවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය වන්නේ මිනින්දෝරු වෘත්තිකයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම වේ. එයට අමතරව, පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීමෙන්, මහජනතාවට තොරතුරු නිකුත් කිරීමෙන්, මහජන පැමිණිලි ඇතුළත් කිරීමෙන් සහ පරීක්ෂණ ගාස්තු ලෙස වූදිත මිනින්දෝරුවරුන්ගෙන් අයකරන පරීක්ෂණ ගාස්තු ආදියෙන්ද මැනුම් සභාවට අරමුදල් එක් රැස් වේ.

2021 වසරේ දෙසැම්බර් මස 31 වන දිනට මැනුම් සභාවේ ස්ථාවර තැන්පතු ගිණුමේ තිබූ අරමුදල් ශේෂය රුපියල් 12,850,944.87 ක් විය.

3). මුල්‍ය කටයුතු විගණනය

මැනුම් සභාව විසින් කරනු ලබන මුල්‍ය කටයුතු විගණකාධිපති විසින් වාර්ෂික විගණනයට භාජනය කරනු ලැබේ. විගණන කළමනාකරණ කමිටුවක්ද මැනුම් සභාව විසින් පත් කර ඇති අතර එය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

i). මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු (සභාපති)

ii). මැනුම් සභාවේ ලේකම් (ලේකම්)

iii). විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු (සාමාජික)

iv). මැනුම් සභාවේ සාමාජිකයකු (සාමාජික)

v). මැනුම් සභාවේ ගණකාධිකාරී (සාමාජික)

ත්‍රෛමාසිකව මෙම කමිටුව රැස් වන අතර එහිදී, සභාවේ කටයුතු විශ්ලේෂණාත්මකව විමසා බලනු ලැබීමෙන් පසු එකී කමිටු වාර්තා මැනුම් සභාවේ අවධානයට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කෙරේ. 2021 වසර සඳහා නිකුත් කරන ලද විගණකාධිපතිගේ විගණන වාර්තාව මෙහි අඩංගු කොට ඇත.

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එස් සිවානන්දරාජා
සභාපති
ඉඩම් මැනුම් සභාව

Chairman
Land Survey Council

11. 2021 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශන (ඇමුණුම්)

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2021 දෙසැම්බර් 31 වන දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

රු.

	සටහන්	2021	2020
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	1	75,730,165.18	75,706,551.53
		75,730,165.18	75,706,551.00
ජංගම වත්කම්			
අවසන් තොගය 31.12.2021	2	313,749.96	
ආපදා ණය	3	425,717.00	585,701.00
ස්ථාවර තැන්පතු	4	12,850,944.87	11,152,808.93
ලැබිය යුතු දෑ	5	94,319.68	140,299.91
මුදල් හා මුදල් සමාන දෑ	6	4,129,980.93	4,579,110.25
			16,457,920.09
මුළු වත්කම්		93,544,877.62	92,164,471.62
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධන දායකත්වය දරනුයේ:			
මහා භාණ්ඩාගාරය		1,043,030.00	1,043,030.00
සම්මුචිත අරමුදල		83,888,310.80	80,074,423.85
අතිරික්තය/ (ඌනතාවය)		958,914.99	3,868,354.73
		84,847,225.79	83,942,778.50
මුළු හිමිකම්		85,890,255.79	84,985,808.58
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම්	7	813,470.50	605,274.00
ජංගම වගකීම්			
උපචිත වියදම්	8	516,234.33	575,524.04
පූර්ව ලැබීම්- මිනින්දෝරු දිනය සඳහා රැස්කළ මුදල්		855,765.00	858,165.00
පූර්ව ලැබීම් ආදායම්	9	5,469,152.00	5,139,700.00
		6,841,151.30	6,573,389.04
මුළු වගකීම්		7,654,621.83	7,178,663.04
මුළු හිමිකම් හා වගකීම්		93,544,877.62	92,164,471.62

ඉඩම් මැනුම් සභාව වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකයන් සාමාජිකයන් වගකියනු ලැබේ.මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මඟින් හෙළිදරවු කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිතා කර ඇත.

එච්.එම්.බී.පී. හේරත්	එස්. සිවානන්දරාජා	කේ.එල්.ඒ.එන් සඳමාලි
ලේකම්	සභාපති	ගණකාධිකාරී
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය	ඉඩම් මැනුම් සභාව	ඉඩම් මැනුම් සභාව

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහාලේඛණ කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

Chairman
Land Survey Council

Land Survey Council

ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

රු.

	සටහන්	2021	2020
ආදායම්			
බලපත්‍ර ගාස්තු		4,520,310.00	4,011,000.00
ලියාපදිංචි කිරීමේ ගාස්තු		466,500.00	550,000.00
ස්ථාවර තැන්පතු පොළිය	10	671,758.82	903,452.03
වෙනත් ආදායම්	11	839,508.15	2,321,447.53
වැඩමුළුවලින් ලත් ශුද්ධ ආදායම		-	641,670.28
මුළු ආදායම		6,498,076.97	8,427,569.84
අඩු කළා: වියදම්			
පරිපාලන හා ආයතනික			
සේවක පාරිශ්‍රමික	12	2,442,480.26	1,880,935.28
අනෙකුත් දීමනා	13	1,638,833.38	1,484,553.57
ගමන් වියදම්	14	175,783.60	74,919.90
පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ යාවත්කාලීන කිරීම		6,500.00	
ලිපිද්‍රව්‍ය		132,450.94	135,342.08
රැස්වීම් සඳහා සංග්‍රහ වියදම්		82,880.00	69,555.00
පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තුව	15	41,845.00	42,422.50
ටෙලිකොම්/ තැපැල් හා සන්නිවේදන කටයුතු		139,459.44	134,341.45
විදුලි වියදම්		74,534.40	74,534.40
පාරිභෝගික සඳහා ප්‍රතිපාදන	7	55,795.00	55,795.00
ජල බිල්පත්		4,200.00	4,200.00
විගණන ගාස්තු		144,000.00	75,600.00
අනෙකුත් වියදම්	16	458,030.14	382,472.93
		5,396,792.16	4,414,672.11
මූල්‍ය හා වෙනත් වියදම්			
බැංකු ගාස්තු		7,000.00	162.00
ක්ෂය කිරීම්		135,369.82	144,381.00
		142,369.82	144,543.00
මුළු වියදම්		5,539,161.98	4,559,215.11
අතිරික්තය/ (ඌනතාවය)		958,914.99	3,868,354.73

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.

	2021	2020
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
අතිරික්තය/ (ඌනතාවය)	958,914.99	3,868,354.73
ගැලපුම් කළා		
ක්ෂය කිරීම්	135,369.82	144,381.00
ස්ථාවර වත්කම් අපහරණය කිරීමේ පාඩුව	-	19,217.43
පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම්	55,795.00	55,795.00
සමුච්චිත අරමුදල සඳහා පූර්ව වර්ෂ ගැලපුම්	98,524.25	-
ස්ථාවර තැන්පතු පොළිය	(671,758.82)	(903,452.03)
කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	576,845.24	3,184,296.13
කාරක ප්‍රාග්ධන වෙනස් වීම්		
තොගය (වැඩිවීම)/(අඩුවීම)	(313,749.96)	-
ආපදා ණය (වැඩිවීම)/(අඩු වීම)	159,984.00	(15,300.00)
ලැබිය යුතු දෑ (වැඩිවීම)/(අඩු වීම)	45,980.23	188,239.99
ගෙවිය යුතු මුදල් (වැඩිවීම)/(අඩු වීම)	(59,289.71)	(124,076.70)
අත්තිකාරම් (වැඩිවීම)/(අඩු වීම)	(2,400.00)	858,165.00
ආදායම්වල පූර්ව ලැබීම් (වැඩිවීම)/(අඩු වීම)	329,452.00	(608,820.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	736,821.80	3,482,504.42
ස්ථාවර තැන්පතු	(1,698,135.94)	(1,789,992.45)
ස්ථාවර වත්කම් මිලදී ගැනුම්	(159,574.00)	(5,000.00)
ස්ථාවර වත්කම් අපහරණය කිරීම් විකිණීමෙන් ලද ආදායම්		5,055.00
ලැබූ පොලී ආදායම්	671,758.82	903,452.03
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(1,185,951.12)	(886,485.42)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
මුදල් හා මුදල් සමාන දැහි ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)	(449,129.32)	2,596,019.00
කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	4,579,110.25	
කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ	4,129,980.93	4,579,110.25

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය

රු.

විස්තරය	සටහන්	ප්‍රාග්ධන ප්‍රදාන	සමුච්චිත අතිරික්තය/(හිඟය	එකතුව
2021 ජනවාරි මස **01** දිනට ශේෂය		**1,043,030.00**	**83,942,778.58**	**84,985,808.58**
එකතු කළා/(අඩු කළා)				-
කාල සීමාව සඳහා අතිරික්තය/(ඌනතාවය)			**958,914.99**	**958,914.99**
				-
20201දෙසැම්බර් **31** වන දිනට ශේෂය		**1,043,030.00**	**84,901,693.57**	**85,944,723.57**

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2021 වසර
රුපියල්

සටහන 1:	දේපළ, පිරියක හා උපකරණ					
අයිතමය	2020.01.01	වර්ෂය තුළ එකතු කිරීම්/අඩු කිරීම්	අඩුකිරීම්	ක්ෂය කිරීම් %	වාර්ෂික ක්ෂය කිරීම්	2020.12.31 දිනට ශුද්ධ අගය
ස්පෘශ්‍ය වත්කම්						
ඉඩම්	75,100,000.00			-		75,100,000.00
යන්ත්‍රෝපකරණ	199,535.59			20%	39,907.12	159,628.47
ගෘහභාණ්ඩ	95,343.65	129,114.00		10%	22,445.77	202,011.89
පරිගණක සහ උපාංග	108,383.91	30,460.00	(590.53)	25%	34,563.35	103,690.04
කාර්යාලීය උපකරණ	1,045.76			25%	261.44	784.32
ඉඩම් මැනුම් සභාවේ නාම පුවරුව	12,937.50	-		20%	2,587.50	10,350.00
ගොඩනැගිලි හා ව්‍යුහය කොටස් (වෙන් කිරීම)	166,741.39	-		20%	33,348.28	133,393.11
අස්පෘශ්‍ය වත්කම්						
ගිණුම්කරණ මෘදුකාංග	22,563.73	-		10%	2,256.37	20,307.36
එකතුව	**75,706,551.53**	**159,574.00**	**(590.53)**		**135,369.83**	**75,730,165.18**

සටහන 2	**2021-12-31** තොගය			
පෙර වසර වල දෝෂ නිවැරදි කිරීම **(2017/2018/2019)(JV NO 136)**				
	ආරම්භක ශේෂය **2017/2018/2019**		**247,464.25**	
	2021 තොගය		**66,285.71**	
	අවසාන තොගය			**313,749.96**

සටහන 3 :	ආපදා ණය		
ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී		129,186.00	
ආර්.එම්.එන්.රත්නායක		129,186.00	
ටී.පී.ප්‍රනාන්දු		167,345.00	
එකතුව			**425,717.00**

සටහන 4:	ස්ථාවර තැන්පතු				
ස්ථාවර තැන්පතු අංකය	ආරම්භ කළ දිනය	කාල සීමාව	වටිනාකම		
82652551	2018.05.10	1 YEAR	1,322,005.97		
82652638	2019.05.10	1 YEAR	1,322,005.97		
82652648	2019.05.10	06 MONTHS	1,319,411.31		
82652661	2019.05.10	06 MONTHS	1,319,411.31		
83986770	2019.03.05	03 MONTHS	500,000.00		
85143581	2019.11.19	06 MONTHS	400,000.00		
85143616	2019.11.19	06 MONTHS	400,000.00		
85143810	2019.11.19	06 MONTHS	400,000.00		
85144124	2019.11.19	06 MONTHS	400,000.00		
85144216	2019.11.19	06 MONTHS	400,000.00		
85144265	2019.11.19	06 MONTHS	400,000.00		
85144298	2019.11.19	06 MONTHS	400,000.00		
85144323	2019.11.19	6 MONTHS	400,000.00		
86795372	2020.12.17	1 YEAR	1,000,000.00		
88130317	2021.11.23	1 YEAR	1,000,000.00		
URVEYORS DAY 202	2021.08.20	3 MONTHS	868,110.31		
87153136	2021.02.22	1 YEAR	1,000,000.00		
එකතුව				**12,850,944.87**	**12,850,944.87**

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2021 වසර

රුපියල්

සටහන අංක 05:	ලැබිය යුතු ආදායම්				
ලැබිය යුතු පරීක්ෂණ ගාස්තු				72,500.00	
ලැබිය යුතු බලපත්‍ර ප්‍රමාද ගාස්තු				6,500.00	
ලැබිය යුතු පැමිණිලි ලියාපෑ				1,500.00	
2021 ලැබිය යුතු බලපත්‍ර ගාස්තු				9,350.00	
ලැබිය යුතු වැටුප් රහිත ආදායම				1,219.68	
ලැබිය යුතු උපසභාපති දීමනා				3,250.00	
එකතුව					94,319.68

සටහන 6:	මුදල් හා මුදල් සමාන දෑ			
ඒක්ෂණ තැන්පතු අංකය		වටිනාකම	වටිනාකම	
85144357		436,895.19		
85144467		436,895.19		
85537997		431,410.12		
87329641		514,951.79	1,820,152.29	
බැංකුවේ ඇති මුදල්			2,309,828.64	
අතැති මුදල්				
එකතුව				4,129,980.93

සටහන 7:	පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම				
නම	සේවයට බැඳුන දිනය		2020 වසර දක්වා	2021 වසර	එකතුව
ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී	2004		367,200.00	22,950.00	390,150.00
ආර්.එම්.එන්.රත්නායක	2013		99,537.00	15,005.00	114,542.00
ටී.ජී. ප්‍රනාන්දු	2004		290,938.50	17,840.00	308,778.50
එකතුව			**757,675.50**	**55,795.00**	**813,470.50**

සටහන 8:	උපචිත වියදම්		
උපචිත විගණන ගාස්තු		288,000.00	
උපචිත බැංකු ගාස්තු		1,500.00	
උපචිත ආපදා ණය පොළිය		545.79	
උපචිත තැපැල් හා විදුලිසංදේශ ගාස්තු		2,358.54	
උපචිත ස්මාට් බලපත්‍ර මුද්‍රණ ගාස්තු		5,760.00	
උපචිත පුහුණුලාභීන් සඳහා වූ දීමනා		48,975.00	
ගෙවිය යුතුව ඇති බලපත්‍ර ගාස්තු 2020		154,560.00	
ගෙවිය යුතු මුද්දර බදු ගාස්තු		14,535.00	
එකතුව			**516,234.33**

සටහන 9:	පූර්ව ආදායම් ලැබීම්		
2020 වර්ෂයේ අබණ්ඩ වෘත්තීය සංවර්ධන කටයුතු වෙනුවෙන් පූර්ව ලැබීම් (2020)		357,500.00	
2022 වර්ෂයේ බලපත්‍ර ගාස්තු වශයෙන් පූර්ව ලැබීම්		5,111,652.00	
එකතුව			**5,469,152.00**

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2021 වසර
රුපියල්

සටහන 10:	ස්ථාවර තැන්පතු පොළිය	
ස්ථාවර තැන්පතු අංකය	පොළිය	
82652606	8,984.54	
82652648	63,869.29	
82652661	63,869.29	
85143581	19,495.89	
85143616	19,495.89	
85143810	19,495.89	
85144124	19,495.89	
85144216	19,495.89	
85144265	19,495.89	
85144298	19,495.89	
85144323	19,495.89	
85537997	16,469.09	
86795372	52,500.00	
87329641	14,951.79	
87805454 SURVEY DAY	9,945.31	
82652638	100,753.34	
82652551	100,753.34	
83986770	22,808.22	
84315875	11,920.65	
84315923	7,767.67	
84315931	7,767.67	
85144357	16,715.75	
85144467	16,715.75	
		6,803,927.85
එකතුව		**671,758.82**

සටහන 11:	වෙනත් ආදායම්	
ප්‍රකාශන අලෙවි ආදායම	16,000.00	
විමර්ශන ලියාපදිංචි කිරීමේ ආදායම	68,000.00	
පරීක්ෂන සඳහා දඩ මුදල් ආ	60,000.00	
ප්‍රමාද බලපත්‍ර ගාස්තු මඟින් ලැබූ ආදායම	204,760.00	
ආයතනයෙන් බැහැර පැවැත්වූ අබන්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ආදායම	45,500.00	
අබන්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ආදායම (මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය)	204,843.00	
වැඩිපුර තැමපත් කිරීම්	27,600.00	
ලියාපදිංචි සහතික නැවත නිකුත් කිරීමේ ආදායම	1,100.00	
වෙනත් ආදායම්	50,480.00	
වැටුප් රහිත නිවාඩු අයකිරීම් ආදායම්	1,219.68	
කළින් ලැබූ ආදායම් (2021)	116,170.00	
මහජනයා වෙත තොරතුරු නිකුත් කිරීම	22,750.00	
එකතුව		**839,508.15**

සටහන 12	පුද්ගල වැටුප් හා චේතන	
මූලික වැටුප්	1,339,080.00	
ජීවන වියදම් දීමනාව	280,800.00	
පුහුණුලාභීන්ගේ දීමනාව	579,618.26	
සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% දායකත්ව	194,385.60	
සේවක භාරකාර අරමුදල සඳහා 3% දායකත්වය	48,596.40	
එකතුව		**2,442,480.26**

සටහන 13:	**වෙනත් දීමනා**		
සභාපති සඳහා දීමනාව		450,000.00	
උප සභාපති සඳහා දීමනාව		360,000.00	
ලේකම් සඳහා දීමනාව		159,525.00	
ගණකාධිකාරි සඳහා දීමනාව		141,308.38	
විගණන හා කළමනාකරණ කමිටු සඳහා දීමනාව		36,000.00	
සභාවේ දීමනාව		492,000.00	
එකතුව			**1,638,833.38**

සටහන 14:	**ගමන් වියදම්**		
ඉඩම් මැනුම් සභාවේ රැස්වීම්		152,127.60	
රට තුළ ගමන් වියදම්		23,656.00	
එකතුව			**175,783.60**

සටහන 15:	**පිරියක යන්ත්‍රෝපකරණ උපකරණ නඩත්තු කිරීම්**		
QB ගිණුම්කරණ පද්ධතිය		7,425.00	
A C මැෂින් නඩත්තු කිරීම		28,620.00	
වෙබ් අඩවිය		5,800.00	
එකතුව			**41,845.00**

සටහන 16:	**අනෙකුත් වියදම්**		
දැන්වීම් - ගැසට් නිවේදන		12,563.64	
භාෂා පරිවර්තන ගාස්තු		41,414.50	
මුද්‍රණ හා බැඳීම් ගාස්තු		286,260.00	
පුද්ගලික ලිපිගොණු සම්පූර්ණ කිරීම		4,740.00	
නීති ගාස්තු		111,000.00	
කාර්යාල පිරිසිදු කිරීම		1,172.00	
විවිධ වියදම්		880.00	
එකතුව			**458,030.14**

සටහන 17:	**සමුච්චිත අරමුදලට පෙර වසර වෙනුවෙන් කරන ලද ගැලපීම්**					
බලපත්‍ර නිකුත් කිරීම	ලියාපදිංචි අංකය	20021523	L/N210732	3,800.00		
බලපත්‍ර නිකුත් කිරීම		20152173	L/N210735	3,300.00		
බලපත්‍ර නිකුත් කිරීම		20152173	L/N 210735	250.00		
බලපත්‍ර නිකුත් කිරීම		20122039	L/N 210737	250.00		
බලපත්‍ර නිකුත් කිරීම		20122039	L/N210737	3,550.00		
බලපත්‍ර නිකුත් කිරීම		20031526	L/N210739	3,300.00		
බලපත්‍ර නිකුත් කිරීම		19911357	L/N 210742	3,300.00		
බලපත්‍ර නිකුත් කිරීම		20202307	L/N211223	3,550.00		
උපචිත විගණන ගාස්තු		2020 දක්වා			600.00	
බලපත්‍ර නිකුත් කිරීම		19831697	L/N 211307	380.00		
බලපත්‍ර නිකුත් කිරීම		20111918	L/N 211321	380.00		
බලපත්‍ර නිකුත් කිරීම		19971400	L/N 211321	380.00		
බලපත්‍ර නිකුත් කිරීම		20202307	L/N211223		3,170.00	
බලපත්‍ර නිකුත් කිරීම		20172132	L/N 211318	380.00		
බලපත්‍ර නිකුත් කිරීම		20021523	L/N 210732		3,420.00	
බලපත්‍ර නිකුත් කිරීම		20152173	L/N210735		3,170.00	
බලපත්‍ර නිකුත් කිරීම		20122039	L/N210737		3,420.00	
බලපත්‍ර නිකුත් කිරීම		20031526	L/N210739		3,300.00	
බලපත්‍ර නිකුත් කිරීම		19911357	L/N210742		3,300.00	
බලපත්‍ර නිකුත් කිරීම		19911235	L/N210665	2,500.00		
උපචිත විගණන ගාස්තු		2020 දක්වා		144,000.00		
පසුගිය වසර තොගය					247,464.25	
එකතුව				**169,320.00**	**267,844.25**	**98,524.25**

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2021 වසර රුපියල්

සටහන 18:	**2021.12.31** දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම					
ස්ථාවර තැම්පත් අංකය		පොළී එකතුව				රු
32652648		9,620.71				
82652661		9,620.71				
85143581		2,391.67				
85143616		2,391.67				
85143810		2,391.67				
85144124		2,391.67				
85144216		2,391.67				
85144265		2,391.67				
85144298		2391.67				
85144323		2391.67				
86795372		2069.89				
87805454		4822.84				
82652638		42289.98				
82652551		42289.98				
83986770		1747.31				
88130317		5805.56				
87153136		42559.52				
එකතුව		**179959.82**				

සටහන් අංක 19 **අවිනිශ්චිත වගකීම් (contingent liability)**

2021වර්ෂයෙ බලපත්‍ර ලබා නොදුන් රජයේ මිනින්දෝරුවරුන් විසින් ගෙවා ඇති බලපත්‍ර ගාස්තු සහ ප්‍රතික්ෂේපිත බලපත්‍ර සඳහා ගෙවන ලද බලපත්‍ර ගාස්තු නැවත ගෙවීම් සඳහා බැදීමක් ඇත
මැනුම් සභාවේ පරිපාලන වියදම් අඩු කල පසු ගෙවිය යුතු මුදල තීරණය කරනු ලැබේ.
මැනුම් සභාවට ලැබී ඇති අයැදුම්පත් අනුව පරිපාලන වියදම් අඩු නොකරන ලද,ගෙවිය යුතු සම්පූර්ණ මුදල රුපියල් **184,650/-**

ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1. පිළියෙල කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති හා **1971** අංක **38** දරන මූදල් පනතේ විධිවිධාන වලට අනුකූලව පිළියෙල කර ඇත.

1.2 මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම අනුව පිළියෙල කර ඇත.

1.3. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සංකල්පය මත පිළියෙල කර ඇත.

2. දේපළ, පිරියත හා උපකරණ

හඳුනා ගැනීමේ පදනම

ඉඩම් - ඉඩම් සාධාරණ අගය මත සටහන් කර ඇත.

අනෙකුත් වත්කම් - ඓතිහාසික පිරිවැය යටතේ හඳුනාගැනේ.

2.1.දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීමෙන් පසු නැවත අයකර ගත හැකි අගයට ගිණුම් ගත කරනු ලැබේ.

2.2. ක්ෂය කිරීම්

හීනවන ශේෂ ක්‍රමයට පහත අනුපාතික යටතේ ඉකුත් වර්ෂය හා අනුකූලව ක්ෂය කිරීම් දක්වා ඇත.

වත්කම් වර්ගය	%
යන්ත්‍රෝපකරණ	20
ගෘහභාණ්ඩ	10
පරිගණක හා උපාංග	25
කාර්යාලීය උපකරණ	25
ඉඩම් මැනුම් සභාවේ නාම පුවරුව	20
ගොඩනැගිලි හා ව්‍යුහ (වෙන් කිරීම්)	20
ගිණුම්කරණ මෘදුකාංග	10

3. බැංකුවල ඇති තැන්පතු හා බැංකුවේ ඇති මුදල්

බැංකු වල ඇති තැන්පතු සම්පූර්ණ වශයෙන්ම සමන්විත වනුයේ ලංකා බැංකුවේ පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු හා ඒක්ෂණ තැන්පතු වශයෙනි.

කෙටි කාලීන වශයෙන් කල් පිරෙන එනම් අත්පත් කරගත් දිනයේ සිට මාස **03**ක් හෝ ඊටඅඩු කාලයක් තුළ කල් පිරෙන ආයෝජන ද මුදල් හා මුදල් සමාන දෑ වශයෙන් සලකනු ලැබේ.

4. පොලී ආදායම හඳුනාගැනීම

මුදල් පදනම මත පොලී ආදායම හඳුනාගැනීම සිදු කෙරේ.

12. විගණකාධිපති වාර්තාව 2021

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඒඑල්/බී/එල්එස්සී/එෆ්එස්/2021/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 ජූලි 11 දින

සභාපති

ඉඩම් මැනුම් සභාව

ඉඩම් මැනුම් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඩම් මැනුම් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

සභාවේ ප්‍රධානතම අදායම් මාර්ගය වන බලපත්‍ර අදායම් වලින් වර්ෂයට අදාල නිවැරදි ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් සභාව විසින් අනුගමනය නොකර සභාවේ බැංකු ගිණුමට බලයලත් මිනින්දෝරුවරු විසින් තැන්පත් කරනු ලබන මුදල් පදනම් කරගෙන රු. 5,111,652 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.ඒසේ වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හඳුනානොගත් ආදායම් ලෙස පෙන්වන රු. 5,111,652 ක් වූ ලැබීම්වලට අදාළ තනි පුද්ගල ගිණුම් හඳුනාගෙන නොතිබුණු අතර අදායම් සැසඳීමක්ද සිදුකර නොතිබුණි.මේ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ආදායමෙහි නිවැරදිතාවය පිලිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2003 ජුනි 02 දිනැති අංක PED/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ 6.5.3 ඡේදය	විගණනය කරන ලද අවසාන ගිණුම් සහ විගණන වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව භාෂා තුනෙන්ම මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සභාවේ 2018, 2019 සහ 2020 වර්ෂවල වාර්ෂික වාර්තා සමාලෝචිත වර්ෂය අවසාන වන විටද සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය	තුන්වන උපලේඛනයේ සඳහන් ආයතන පමණක් බදු ගෙවීමෙන් නිදහස් කර තිබුණි. ඉඩම් මැනුම් සභාව එහි සඳහන් ආයතනයක් නොවන නමුත් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, බදු ගෙවීමෙන් නිදහස් වී ඇත්නම් ඒ සඳහා ලැබී ඇති අනුමැතීන් කිසිවක් පිළිබඳ සාක්ෂිද විගණනයේදී නිරීක්ෂණය නොවීය.
(ඇ) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ	තොරතුරු නිලධාරියකු පත් කර නොතිබුණි.

පනතේ 23 (1) (අ) ප්‍රකාරව
තොරතුරු නිලධාරියකු පත්
කළ යුතුව තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

		බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ)	2002 ඔක්තෝම්බර් 04 දිනැති 2002 අංක 17 දරන මැනුම් පනතේ		
(i)	37(උ)	ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව, පිළිගැනීම යන කරුණුවලදී සම තත්ත්වයක් සහ අන්‍යෝන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමග අන්‍යෝන්‍ය වැඩ පිළිවෙලවල් සඳහා එකඟතාවය ඇති කර ගැනීම ක්‍රියාත්මක කිරීම.	මෙම කාර්යයන්. නිසි පරිදි ඉටු කර නොතිබුණි
(ii)	38 (ඇ)	සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.	සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් ප්‍රමාණවත් පරිදි පත් කර නොතිබුණි.
(iii)	38 (උ)	සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම.	සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම සිදු කර නොතිබුණි.
(iv)	46	සභාව වෙත ඉදිරිපත් කෙරෙන මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ පැමිණිලි විභාග කිරීම.	2020 වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 113 න් 80 ක් ද, 2021 වර්ෂයේදී

			ලැබී තිබුණු පැමිණිලි 143 න් 104 ක් ද විසඳා නොතිබුණි.
(v)	32 (1)	සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයෙකු සිටිය යුතුය	සභාව සඳහා ස්ථිර ලේකම්වරයෙකු පත් කර ගැනීමට 2002 සිට 2021 වර්ෂය දක්වාද නොහැකි වී තිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති